# වගවීමේ ප්‍රමිතීන්

අපගේ කාර්යයන්ට අනුබල දෙන හා ඉන් ප්‍රතිලාභ ලබන ප්‍රජාවන්, සංවිධාන, සාමාජිකයන්, හවුල්කරුවන් සහ කණ්ඩායම්වලට වගවීමට අපි උත්සාහ කරන්නෙමු. MenEngage Alliance ජාලය හරහා අප අතර වගවීම මෙයට ඇතුළත් වේ. අපගේ සියලු පාර්ශ්වකරුවන්ට පිළිතුරු දීමට අපි කැපවී සිටින අතර, අපගේ තීරණ සහ ක්‍රියාවන් හෝ අකර්මන්‍යතාවයන් සඳහා අප වගකිව යුතු බව පිළිගන්නෙමු.

පහත සඳහන් ප්‍රමිතීන් පුද්ගලික, ආයතනික සහ ජාල මට්ටම්වල වගකියන පරිචයන් සඳහා මඟ පෙන්වයි. ඉන් සමහරක් පුද්ගල මට්ටමින් MenEngage Alliance හි සාමාජිකයන් වෙත යොමු කෙරේ; අනෙක් ඒවා MenEngage Alliance හි විවිධ මට්ටම්වල නායකයින් උදෙසා වන අතර සමහර මාර්ගෝපදේශ අපගේ සාමාජික සංවිධාන සහ ජාල සඳහා අදාළ වේ.

අපේක්ෂාවන් සහ සීමා මායිම් නිර්මාණය කිරීම, යහපත් භාවිතයන් සහ වගවීමේ සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, වඩා ශක්තිමත් සබඳතා නිර්මාණය කිරීම, වැරදි ක්‍රියා වැළැක්වීම සහ කළමනාකරණය කිරීම මේවායේ අරමුණ යි. මෙම ප්‍රමිතීන් MenEngage Alliance හි මූලික ප්‍රතිපත්ති, චර්යාධර්ම සංග්‍රහය, ලිංගික හිරිහැර පිළිබඳ වූ ප්‍රතිපත්ති සහ ළමා හා යෞවනයන් ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්තිය සමඟ ඒකාබද්ධ ව ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන අතර, මෙම සෑම මෙවලමක් ම අනෙක් ඒවාට අනුපූරක වේ.

MenEngage කලාපීය හා දේශීය ජාල විසින් මෙම ප්‍රමිතීන් සුදුසු පරිදි අනුවර්තනය කරගැනීම හා සන්දර්භගත කරගැනීම අපේක්ෂිත ය.

## සාමාන්‍ය ප්‍රමිතීන්

1. ස්ත්‍රීවාදී කාන්තා අයිතිවාසිකම්, LGBTIQ අයිතිවාසිකම් සහ තරුණ ක්‍රියාකාරී සංවිධාන, ජාල සහ ව්‍යාපාර සඳහා සහය දක්වන්නන් ලෙස කටයුතු කරන්න. ඔවුන් සමඟ විවෘත හා අර්ථවත් සංවාදවල නිරත වන්න. ඔබේ කාර්යයන්ට ඔවුන් විසින් කරන අනුබලය පිළිගනිමින් ඔවුන්ගේ ප්‍රතිපෝෂණ සොයමින් ඒවාට ප්‍රතිචාර දක්වන්න. ඔවුන්ගේ නායකත්වය, නියෝජිතායතනය, හඬ සහ අවකාශයන්ට ගරු කරන්න. ඔවුන්ගේ දැක්ම, න්‍යාය පත්‍ර, දේශපාලන ව්‍යාපාර සහ ක්‍රියා සඳහා සහාය වන්න.

2. ස්ත්‍රීවාදී කාන්තා අයිතිවාසිකම් සංවිධාන, LGBTIQ+ තරුණ, ළමා අයිතිවාසිකම්, ජාතිවාදයට විරෝධී, දේශගුණික සහ විවිධ සමාජ සාධාරණත්ව පදනම් සඳහා බිහිවුණු සංවිධානවලට සවන් දෙන්න, උපදෙස් ලබාගන්න හා ඔවුන් සමඟ අර්ථවත් හවුල්කාරිත්වයක් ගොඩනගා ගන්න. මෙම ව්‍යාපාරවල නියෝජිතයන්, උපදේශකයින් ලෙෂ උපදේශක මණ්ඩලයේ, අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ මෙහෙයුම් කමිටුවල සිටීම, වගවීමේ සංවාද පැවැත්වීම යනාදී වශයෙන් මෙය ක්‍රියාත්මක කළ හැකි විවිධ ක්‍රම ගැන සිතන්න.

3. කාන්තාවන්, ගැහැනු ළමයින් සහ එක් ස්ත්‍රී පුරුෂ සමාජභාවයකට අයත් නොවන පුද්ගලයින්ගේ අත්දැකීම් සහ හඬ - විශේෂයෙන් ම ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ලිංගිකත්වය, වාර්ගික, ආර්ථික, සහ විවිධ අනන්‍යතා හේතුවෙන් වඩාත් කොන් වුවන් - අපගේ කාර්යයන්හි දී කේන්ද්‍රීය විය යුතු ය.

4. ස්ත්‍රීවාදී ව්‍යාපාර තුළ ඇති විවිධත්වය හඳුනා ගන්න සහ අනෙකුත් ස්ත්‍රීවාදීන්ගේ අදහස් සමඟ ගැටෙන ඇතැම් ස්ත්‍රීවාදී මතවාදයන්ට සහාය වීමේ දී හොඳින් විමසිලිමත් වන්න. ඇතැම් කණ්ඩායම්වල පැත්ත ගැනීමෙන් වළකින්න සහ එමගින් අප වගකිව යුත්තේ "කොයි කණ්ඩායම්වලට" දැයි වෙන්කර හඳුනා ගන්න. ස්ත්‍රීවාදී ව්‍යාපාරවල විවිධත්වයන් තුළ පවතින පොදු මූලධර්මවලට සහාය වන්න.

5. පිරිමින්ගේ සහ පිරිමි ළමුන්ගේ විවිධ අනන්‍යතා, අත්දැකීම්, අවශ්‍යතා සහ අභිලාෂයන් ගැන සවන් දී ඉගෙන ගන්න. බලය, වරප්‍රසාද සහ හානිය සමඟ ඔවුන්ගේ සංකීර්ණ සබඳතා තේරුම් ගන්න. පිරිමින් සහ පිරිමි ළමයින් සමඟ ඔබේ වැඩ කිරීමේ දී බලය, වරප්‍රසාද සහ පිරිමින්ගේ වගකීම් පිළිබඳ ආමන්ත්‍රණය කරන්න.

6. පුද්ගලයින්ගේ අභ්‍යන්තර කටයුතු සඳහා කැප වන්න. ස්වයං දැනුවත්භාවය, ස්වයං රැකවරණය සහ සුව කිරීම සඳහා ඔබේ සමාජ ක්‍රියාකාරිත්වය පදනම් කරන්න. පුද්ගලික සහ පොදු යන ක්ෂේත්‍ර දෙකෙහි ම වරප්‍රසාද සහ බලය පිළිබිඹු කිරීමට කැප වන්න. අන්‍යෝන්‍ය රැකවරණය, සුවය, අභ්‍යන්තර පරිවර්තනය, විවේචනාත්මක ස්වයං ආවර්ජනය සහ යහපැවැත්මේ සාමූහික අවකාශයන් පෝෂණය කරන්න.

7. ඔබේ කාර්යයන් ප්‍රසිද්ධියේ, විවෘතව සිදු කරන අතර ම විවේචන බාරගැනීමට විවෘත වන්න. අපගේ මූලධර්මවලට පටහැනි ව ක්‍රියාත්මක වන පුද්ගලික හෝ ආයතනික භාවිතයන්ට විරුද්ධ ව ක්‍රියාමාර්ග ගන්න. සිදු වූ හානිය පිළිගෙන නිවැරදි කරන්න.

8. තොරතුරු සහ බලය බෙදාහදා ගන්නා  වගවීමේ සංස්කෘතියක් අපගේ ජාලය සහ සංවිධානය තුළ නිර්මාණය කරගන්න. ඔබේ සගයන් කෙරෙහි ඔබේ කැපවීම පෙන්වන්න. අන් අයට වග වන හොඳ කණ්ඩායම් සාමාජිකයෙකු වන්න. එකිනෙකාට වගකීමෙන් සිටින්න.

## ආයතනික, ජාතික සහ කලාපීය ජාල මට්ටමින් වගවීම

1. සන්ධානයේ මූලික මූලධර්ම, චර්යාධර්ම සංග්‍රහය, වගවීමේ ප්‍රමිතීන් සහ ලිංගික හිංසන ප්‍රතිපත්ති අනුවර්තනය කිරීමට සහ සන්දර්භගත කිරීමට සාමාජික සංවිධානවලට සහ MenEngage ජාලවලට සහාය වන්න. මෙම මෙවලම් සන්දර්භයට ප්‍රතිචාරාත්මක වන හා සාමූහික ව හිමිකාරිත්වය ඇති ඒවා බවට පත්කරගන්න.

2. පිරිමින් සහ පිරිමි ළමයින් සමග වැඩ කිරීම පිළිබඳ විවේචනාත්මක ආවර්ජනයන් ප්‍රවර්ධනය කිරීමට, වැඩිදියුණු කිරීම් සඳහා ක්ෂේත්‍ර හඳුනා ගැනීම සහ වගවීම සඳහා උපාය මාර්ග හඳුනාගන්න.

3. අන්තර් ඡේදනීය ස්ත්‍රීවාදී මූලධර්ම සහ නායකයින් සහ සාමාජිකයින් සමඟ වගවීමේ යාන්ත්‍රණවල හැකියාවන් ශක්තිමත් කරන්න.පුහුණු වැඩමුළු සහ අනෙකුත් ඉගෙනුම් අවස්ථා සංවිධානය කරන්න.

4. සාමාජික සංවිධාන, රටවල සහ කලාපීය ජාලවල පරිපාලන සහ තීරණ ගැනීමේ ව්‍යුහයන් තුළ කාන්තා අයිතිවාසිකම් වෙනුවෙන් හඬනගන නායකයින් සහ සංවිධාන, තරුණ නායකයින්, ජාතිවාදයට විරුද්ධ, LGBTQIA+ අයිතීන් සහ අනෙකුත් සමාජ සාධාරණත්ව ව්‍යාපාරවල අර්ථවත් සහභාගීත්වය සහ නායකත්වය ප්‍රවර්ධනය කරන්න. නායකත්ව තනතුරු තුළ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ඇති කර ගැනීම අරමුණු කරගන්න.

5. ප්‍රධාන පාර්ශ්වකරුවන් (කාන්තා සහ LGBTQIA+ අයිතිවාසිකම් සංවිධාන, ස්වදේශික සහ ජාතිවාදයට විරෝධී ව්‍යාපාර, තරුණ හා ළමා අයිතිවාසිකම් කණ්ඩායම්, සහ වෙනත් ඕනෑ ම ආන්තික කණ්ඩායම්) සමඟ වගවීම පිළිබඳ සංවාද පවත්වන්න.

## ගැටලු සහ පැමිණිලිවලට ප්‍රතිචාර දැක්වීමේ දී වගවීම

1. පුද්ගලයන්ට සහ සංවිධානවලට ඔවුන් සැලකිලිමත්වන කාරණා සහ පැමිණිලි ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි සංවිධානාත්මක සහ ජාල සංස්කෘතියක් සහ යාන්ත්‍රණයක් පෝෂණය කරන්න.

2. සංධානයේ සහ එහි සාමාජිකයින්ගේ කටයුතු පිළිබඳ ව ඕනෑ ම කෙනෙකුට පැමිණිලි ගොනු කිරීමට හෝ විවේචනාත්මක ප්‍රතිපෝෂණ ලබා දීමට හැකි ආකාර කිහිපයකට ඉඩ සලසන්න. නිර්නාමික පැමිණිලි යාන්ත්‍රණයක් ස්ථාපිත කරන්න. ප්‍රතිපෝෂණ සෙවීමට සහ රැස් කිරීමට MenEngage Global [reporting page] භාවිත කරන්න සහ ප්‍රවර්ධනය කරන්න.

3. වහා ක්‍රියාත්මක වන්න. සියලු ම පැමිණිලි සහ විමසීම්වලට අවධානය යොමු කරන්න. පැමිණිලි ලැබුණු බව පිළිගෙන, ඒවා කඩිනමින් විසඳීමට කැපවී නියමිත වේලාවට වාර්තා කරන්න.

4. පැමිණිලි පිළිබඳ අපක්ෂපාතී විමර්ශනයන් සහතික කරමින් සියලු පාර්ශ්වයන්ට සාධාරණ ලෙස සලකන්න. පුද්ගලිකත්වය සහ ආරක්ෂාව සඳහා ඔවුන්ගේ අයිතිවාසිකම්වලට ගරු කරන්න. රහසිගත තොරතුරු හෙළිකරන්නන් ආරක්ෂා කරන්න. මෙම ක්‍රියාවලින් සඳහා සහාය විය හැකි මධ්‍යස්ථ පාර්ශවයන් සලකා බලන්න.

5. හැකි සෑම විට ම, විපතට පත් වූවන් එකඟ වන්නේ නම්, ප්‍රතිෂ්ඨාපන යුක්ති ප්රවේශයක්[1] අනුගමනය කරන්න. වගවීම පිළිබඳ නරක හැසිරීම් රටාවලට 'විරුද්ධ වනවා' පමණක් නොව, වැරදි කළ පුද්ගලයින්ට ආවර්ජනය කිරීමට, ඉගෙන ගැනීමට, සංශෝධන සිදු කිරීමට සහ වඩා හොඳින් ක්‍රියාත්මක වීමට හැකි අවකාශයන් ද වර්ධනය කරන්න.

6. MenEngage ජාල සහ සාමාජිකයින් විසින් රටවල්වල සහ කලාපීය මට්ටමින් මෙහෙයවන දේශීය වගවීමේ යාන්ත්‍රණයන් ශක්තිමත් කරන්න. ප්‍රාදේශීය මට්ටමින් සිදු වූ ගැටලුවලින් සැලකිමත් කාරණා සහ පැමිණිලි පැමිණෙන විට, MenEngage සන්ධානයේ ජාතික, කලාපීය සහ ගෝලීය වශයෙන් ගත යුතු ප්‍රතිචාරයේ භූමිකාවන් මොනවා ද යන්න පිළිබඳ ව එකඟ වී සහයෝගීතාවය වෙනුවෙන් ක්‍රියාත්මක වන්න.

## වගකීම් සහගත වැඩසටහන්කරණය

1. ව්‍යාපෘති සහ මුලපිරීම් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම සඳහා කාන්තා අයිතිවාසිකම්, LGBTIQA+ අයිතිවාසිකම් වෙනුවෙන් වැඩ කරන සහ තරුණයන් විසින් මෙහෙයවන (අදාළ පරිදි) සංවිධාන සමඟ අර්ථවත් ලෙස හවුල් වන්න. නව ව්‍යාපෘති හෝ මුලපිරීම් සැලසුම් කිරීමේ දී මෙම ව්‍යාපාරවල නායකයින් සමඟ සාකච්ඡා කරන්න. හැකි සෑම විට ම, ප්‍රාදේශීය කාන්තා සංවිධාන සහ නායිකාවන්ගෙන් සහය ඉල්ලා සිටින විට ගෙවීම් හෝ වෙනත් දිරිගැන්වීමේ දීමනා ලබා දෙන්න.

2. කාන්තාවන්, ගැහැනු ළමයින් සහ එක් ස්ත්‍රී පුරුෂ භාවයට අනුකූල නොවන පුද්ගලයින් විසින් ඔවුන්ගේ ප්‍රජාවන්හි පිරිමින් සහ පිරිමින් ළමයින් සමඟ කරන මැදිහත්වීම් පිළිබඳ ප්‍රතිපෝෂණ ලබා දෙන බවට සහතික වන්න.[2] ඔබේ කාර්යය ඔවුන්ගේ අවශ්‍යතා සහ අභිලාෂයන් අනුව හැඩගැසෙන බවට සහතික වන්න. ඒවා ඔබේ තීරණ ගැනීමේ ක්‍රියාවලියේ කොටසක් බවට පත් කරන්න.

---

[1] මෙම ප්‍රවේශය පිළිබඳ වැඩි විස්තර සඳහා සන්ධානයේ ලිංගික හිරිහැර ප්‍රතිපත්තිය වෙත යොමු වන්න

[2] International Rescue Committee (2013). Preventing Violence Against Women and Girls: Engaging Men Through Accountable Practice. A transformative individual behavior change intervention for conflict-affected communities. New York: IRC.

3. පිරිමින්, පිරිමි ළමුන් සහ පිරිමින් ලෙස හඳුන්නා පුද්ගලයින් සමග වැඩ කිරීමට මැදිහත්වීම් සහ වැඩසටහන් සැලසුම් කිරීමේ දී ස්ත්‍රී පුරුෂ සමාජභාවීය පරිවර්තනීය සහ අන්තර්ඡේදන ප්‍රවේශයන් සහතික කරන්න; පණිවිඩ සහ ක්‍රියාවලින් තුළ පුරුෂාධිපත්‍යය, සුදු සමට පවතින ආධිපත්‍යය, සමලිංගිකහෝබියාව සහ සංක්‍රාන්ති ලිංගික හෝබියාව ප්‍රවර්ධනය කිරීමෙන් වළකින්න.

4. සහභාගිවන්නන්ගෙන් සහ/හෝ වැඩසටහන් නායකයින්ගෙන් පිරිමින් සහ පිරිමි ළමුන් සමඟ ක්‍රියාකාරකම්වල දී පිරිමි බලය සහ වරප්‍රසාද ඉස්මතු වනු ඇති බව සිහිපත් කරගන්න. එබැවින්, හානිකර ප්‍රකාශ හෝ ක්‍රියාවන් ආමන්ත්‍රණය කිරීමට සහ කණ්ඩායම් නායකයින්ට දැඩි පුහුණුවක් සහ අඛණ්ඩ සහයෝගයක් ලබා දීමට සූදානම් ව සිටින්න.

5. ”හානියක් නොකිරීමේ” මූලධර්මය මගින් වැඩසටහන් සහ මුලපිරීම් නිසි ලෙස දැනුවත් කර ඇති බවට සහතික වන්න. මෙයින් අදහස් වන්නේ, අයුක්තිය සහ අසමානතාවයට හානි කිරීමට හෝ ශක්තිමත් කිරීමට හැකි ඕනෑ ම අනපේක්ෂිත ප්‍රතිවිපාක ගැන සුපරීක්ෂාකාරී ව සිටීම යි. අපගේ ක්‍රියාකාරකම්, වැඩසටහන් සහ ව්‍යාපෘති මගින් බලපෑමට ලක්වන සියලු ම පුද්ගලයින්ගේ ආරක්ෂාව සහ යහපැවැත්මට ප්‍රමුඛත්වය දෙන්න.

ග

6. පිරිමින් සහ පිරිමි ළමුන් සමග ස්ත්‍රී පුරුෂ සමාජභාවය පරිවර්තන ක්‍රියා පුද්ගලික, සම්බන්ධතා, ආයතනික සහ ව්‍යුහාත්මක මට්ටම් හරහා ක්‍රියාත්මක වන බව සලකන්න. ඔබේ කාර්යය මෙම මට්ටම්වලින් එකක් කෙරෙහි පමණක් අවධානය යොමු කරන්නේ නම්, අනෙක් ඒවා මත වැඩ කරන අය සමඟ හවුල්කාරිත්වයන් සෙවීමට උත්සාහ ගන්න.

7. පිරිමින් සහ පිරිමි ළමයින් සමඟ අප කරන කාර්යයේ බලපෑම සහ පිරිමිකම් පරිවර්තනය කිරීම පිළිබඳ සාක්ෂි ගොඩනගන්න. උගත් පාඩම් එකතු කිරීමට සහ පොරොන්දු වූ පරිචයන් ලේඛනගත කිරීමට ඔබේ වැඩසටහන් අධීක්ෂණය, ඇගයීම සහ ඉගෙනුම් සමඟ ඒකාබද්ධ කරන්න.

## වගවීමේ උද්දේශනය

1. ස්ත්‍රීවාදී උපදේශන න්‍යායපත්‍ර සමග පෙළගැසී කටයුතු කරමින් ඔවුන්ගේ කාර්යය විස්තාරණය කරන්න. ස්ත්‍රීවාදී, ජාතිවාදී විරෝධී, තරුණ සහ අනෙකුත් සමාජ සාධාරණත්වය වෙනුවෙන් පෙනී සිටින සහයෝගිතා ක්‍රියා මොනවා ද යන්න ගැන ඉගෙන ගන්න. ඔවුන්ගේ ක්‍රියාවන්ට ප්‍රසිදධිය ලබා දෙන්න, පෙළපාලිවලට සම්බන්ධ වන්න, සහ ඔවුන්ගේ යෝජනා වෙනුවෙන් කරන ආධාරයන් සඳහා වන ඉල්ලීම්වලට සහාය ලබාදෙන්න.

2. පිරිමි සහ පුරුෂ දෘෂ්ටි කෝණයක් තුළින් පුළුල් ස්ත්‍රීවාදී සහ සමාජ සාධාරණත්වය පිළිබඳ න්‍යාය පත්‍රයට වටිනාකමක් එක් කරන්න.

3. ස්ත්‍රීවාදී, කාන්තා අයිතිවාසිකම්" SOGIESC"(ලිංගික දිශානතිය, ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාව සහ ඒ හා බැඳුනු ප්‍රකාශනයන් සහ ලිංගික චරිත ස්වභවෙයන් ) ජාතිවාදී විරෝධී, දේශගුණික, තරුණ, සහ සමාජ සාධාරණ ක්‍රියාකාරීන්, සංවිධාන, ජාල සහ ව්‍යාපාර සමඟ උපදේශන හවුල්කාරිත්වයන් ගොඩනගන්න. ස්ත්‍රීවාදී කාන්තා අයිතිවාසිකම් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ව්‍යාපාරයන් පිළිබඳ උපදේශන අවශ්‍යතා ඔබේ උපදේශන අරමුණුවලට ඒකාබද්ධ කරන්න.

4. ඔබ වැඩ කරන ප්‍රතිපත්ති අවකාශයන්හි ජාත්‍යන්තර, කලාපීය, ජාතික හෝ ප්‍රාදේශීය වශයෙන් අර්ථවත් උපදේශන හවුල්කාරිත්වයන් පෝෂණය කරන්න. ඔබ විසින් ම ගොඩනගාගත් රාමු තුළ තරඟ කිරීමෙන් හෝ වැඩ කිරීමෙන් වළක්වන්න.

5. පුරුෂාධිපත්‍ය න්‍යාය පත්‍රයක් කේන්ද්‍රගත කරන හෝ පුරුෂාධිපත්‍යයේ ගොදුරු පිරිමින් පමණක් ලෙස සලකන මතවාදවලට අභියෝග කරන්න. කාන්තාවන්ගේ සහ ගැහැනු ළමයින්ගේ අවශ්‍යතා සඳහා පිළිගැනීම සහ සම්පත් කේන්ද්‍රගත කරන උත්සාහයන් සමඟ තරඟකාරීතවයකට පිවිසීමෙන් වලකින්න.[3]

6. පිරිමින් සහ පුරුෂයන් පිළිබඳ සියලු ප්‍රතිපත්තිමය කටයුතු පිළිබඳ අන්තර්ඡේදනීය ස්ත්‍රීවාදී දේශපාලන විශ්ලේෂණයක් හරහා ඉදිරියට ගෙන යාමට කැප වන්න. අදේශපාලනික සහ ස්ත්‍රීවාදී අරගල සහ යථාර්ථයන් තුළ ගොඩ නොනැගුනු න්‍යාය පත්‍රයක් සහිත උත්සාහයන්ට එරෙහි වන්න.

7. ප්‍රතිපත්ති තුළ පිරිමි සහ පුරුෂ දෘෂ්ටි කෝණයක් ඇතුළත් වන විට, ප්‍රතිපත්ති සැලසුම්, අන්තර්ගතය, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ ඇගයුමෙන් ස්ත්‍රීවාදී ක්‍රියාවලියක් සහ විශ්ලේෂණයක් අනුගමනය කිරීමට උපදෙස් දෙන්න.

## වගකීම් සහගත අරමුදල් රැස් කිරීම

1. පිරිමින් සහ පිරිමි ළමයින් සමඟ වැඩ කිරීම සඳහා ඔබේ අරමුදල් රැස්කිරීමේ දී කාන්තා අයිතිවාසිකම් සංවිධානවලට, විශේෂයෙන් අරමුදල් සමඟ අරගල කරන කුඩා සංවිධානවලට ඇති කළ හැකි බලපෑම ගැන සැලකිලිමත් වන්න. තරඟකාරිත්වය වැළැක්වීමට සහ සම්පත් බෙදා ගැනීමට සඳහා:

   - පොදුවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පරිවර්තන කටයුතු සඳහා සහ විශේෂයෙන් ම කාන්තා අයිතිවාසිකම් සිවිල් සමාජ සංවිධාන සඳහා වැඩි සම්පත් යොදවීමට ධන පරිත්‍යාගශීලීන් උනන්දු කරවීම
   - ව්‍යාපෘති සැලසුම් කිරීමේ දී, අරමුදල් රැස් කිරීමේ සහ බෙදා හැරීමේ දී කාන්තා අයිතිවාසිකම් සංවිධාන සමඟ හවුල් වීම
   - දේශීය කාන්තා මූලික කණ්ඩායම් සහ මුලපිරීම් සඳහා අරමුදල්වල ප්‍රධාන කොටස වෙනුවෙන් උද්දේශනය කිරීම
   - තොරතුරු හුවමාරු කරගැනීම හෝ නව අරමුදල් රැස්කිරීමේ අවස්ථා සාකච්ඡා කෙරෙන අවකාශයන් වෙත කාන්තා අයිතිවාසිකම් සංවිධානවලට ආරාධනා කිරීම
   - ස්ත්‍රී පුරුෂ සමාජභාවය වෙනුවෙන් වැඩ කරන අය අතර ඇති විය හැකි තරඟකාරිත්වය සහ බල ධුරාවලිය අඩු කිරීම පිළිබඳ ව ධන පරිත්‍යාගශීලීන් තුළ දැනුවත්භාවය ඇති කිරීම

---

[3] Panel discussion: Accountable practices for engaging men and boys in preventing violence against women and girls. Co-sponsored by: WHO, UNAIDS and CERAH. Dec. 2019

2. අරමුදල් රැස් කිරීම ආරම්භ කිරීමට පෙර, කාන්තා අයිතිවාසිකම් සංවිධාන විසින් පිරිනමනු ලබන සේවාවන් සඳහා අරමුදල් සපයන ආකාරය තක්සේරු කර, ඔවුන් සඳහා සම්පත් වෙනුවෙන් පෙනී සිටින්න.

### ළමයින්ට, තරුණ ප්‍රජාවට සහ තරුණයින්ට වගකිව යුතු වීම

1. සාමාජික සංවිධාන සහ ජාල තුළ තීරණ ගැනීමේ ව්‍යුහයන් තුළ මෙන් ම අනෙකුත් අවකාශයන්හි තරුණ නායකත්වය සහ අර්ථාන්විත නියැලීම ශක්තිමත් කරන්න. ළමුන් සහ යෞවනයන් වෙනස් කොට සැලකීමේ පද්ධතිමය මෙවලමක් ලෙස වැඩිහිටිභාවයට අභියෝග කරන්න.

2. MenEngage Alliance හි කරයයයන් සහ සංවිධානය කිරීම සඳහා තරුණ තරුණියන්ගේ නායකත්වය, විශේෂඥභාවය සහ ඔවුන්ගේ විවිධත්වයේ ඉදිරිදර්ශන කේන්ද්‍රීය වන බවට සහතික කර ගන්න.

3. ප්‍රාදේශීය වශයෙන්, ජාතික වශයෙන් සහ කලාපීය මට්ටමින් තරුණ ප්‍රජාව ශක්තිමත් කරන්න. ඊට අමතර ව, පරම්පරා අතර දැනුම හුවමාරුව සහ සංවාද ප්‍රවර්ධනය කරන්න.

4. MenEngage Alliance හි වැඩකටයුතුවලට නායකත්වය දීමට සහ සහභාගී වීමට තරුණ තරුණියන්ට කුසලතා සහ දැනුම ඇති බව හඳුනා ගන්න. නව පරපුරේ නායකයන්ට මංපෙත් විවර කිරීම ඇතුළු තරුණ නායකත්වය සඳහා අවස්ථා නිර්මාණය කිරීමේ වගකීම වැඩිහිටි නායකයන්ට තිබේ.

5. අපගේ ක්‍රියාකාරකම්වලට සහභාගී වන සියලු ම ළමුන් සහ තරුණයින් සඳහා ඔබේ සංවිධානය සහ ජාලය සුරක්ෂිත පරිසරයක් සපයන බව සහතික කිරීම සඳහා ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි අනුගමනය කරන්න. ළමුන් සහ තරුණයින් ආරක්ෂා කිරීම සඳහා කැපවීම අපගේ ප්‍රමුඛතාවයකි.[4]

---

[4] Find out more: MenEngage Safeguarding Children and Young People Policy